**සීමාසහිත සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2021/2022/2023**

---

සීමාසහිත සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2021, 2022 සහ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂවල මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2021, 2022 හා 2023 වර්ෂයන්ට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2 වත්කම් , වගකීම්, ආදායම් හා වියදම්

සමාගම විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 55,572,787 |
| ජංගම වත්කම් | 216,482,032 |
| | ------------ |
| **මුළු වත්කම්** | **272,054,819** |
| | ========= |

<u>ස්කන්ධය හා වගකීම්</u>

| | |
|---|---:|
| ස්කන්ධය | 13,553,260 |
| <u>වගකීම්</u> | |
| ජංගම නොවන වගකීම් | - |
| ජංගම වගකීම් | 258,501,559 |
| | ------------- |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | **272,054,819** |
| | ======== |
| මුළු ආදායම | 60,302,442 |
| මුළු වියදම | (63,276,790) |
| | -------------- |
| **බදු පෙර ලාභය/(අලාභය)** | **(2,974,348)** |
| | ======== |

## 2.3 ගිණුම් හා පොත් පවත්වාගෙනයාම

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2023 සහ 2024 වර්ෂ සඳහා ගෙවීම් මුදල් පොත් තුලනය කර නොතිබූ අතර, එම වර්ෂ සඳහා ලැබීම් මුදල් පොත පවත්වාගෙන ගොස් නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | පොත් සහ වාර්තා නිසි ලෙස පවත්වාගත යුතුය. |
| (ආ) 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | බැංකු සැසඳුම් ප්‍රකාශන මාසිකව පිළියෙල කළ යුතුය. |
| (ඇ)පවතින ගිණුම්කරණ පද්ධතිය 2024 ජනවාරි මාසයේදී යාවත්කාලීන කර තිබුණද, 2023 මැයි දක්වා ගනුදෙනු පමණක් පද්ධතිය තුළ වාර්තා වී තිබුණි | පිළිතුරු ලබාදී නොමැත. | ගනුදෙනු පද්ධතිය තුළ වාර්තා කර යාවත්කාලීන කළ යුතුය. |

## 2.4. විගණනය සඳහා තොරතුරු

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 සහ 2022 වර්ෂ සඳහා මුදල් පොත, ගෙවීම් වවුචර් සහ රිසිට්පත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | පොත් සහ වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

**නීතී, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් පහත දැක්වේ.**

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යවසායන්ගේ සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) 2.2.2 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ක්‍රමානුකූලව, අවම වශයෙන් මසකට වරක්වත් පැවැත්වෙන බවට සභාපතිවරයා සහතික විය යුතුය. කෙසේ වෙතත්, 2021, 2022 සහ 2023 වර්ෂවල පිළිවෙලින් රැස්වීම් 03ක්, 04ක් සහ 04 ක් පමණක් පවත්වා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මාර්ගෝපදේශ අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතුය. |
| (ii) 2.3 වගන්තිය | 2012 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සකස් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මාර්ගෝපදේශ අනුව ක්‍රියාකාරී සැලසුම්, සංයුක්ත සැලසුම් සහ අයවැය සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) 4.2 වගන්තිය | සමාගම විසින් විගණන කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මාර්ගෝපදේශ අනුව විගණන කමිටුවක් ස්ථාපිත කළ යුතුය. |
| (iv) 4.4 වගන්තිය | අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොත | | | |
| (i) 3.1 සහ 3.2 වගන්ති | සමාගම සඳහා කාර්ය මණ්ඩලය සහ බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර අනුමත කරවා ගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | කාර්ය මණ්ඩලය සහ බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 6.7 වගන්තිය | ස්ථාවර වත්කම් සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපනය සිදු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මෙහෙයුම් අත්පොත ප්‍රකාරව අනුව වත්කම් සත්‍යාපනය සිදු කළ යුතුය. |
| (iii) 7.5 වගන්තිය | මාසික, කාර්තුමය සහ වාර්ෂික කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | මෙහෙයුම් අත්පොතට ප්‍රකාරව වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා තිබුණද, ඒ සඳහා කුලී ගිවිසුමකට එළඹ නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ගොඩනැගිල්ල සඳහා කුලී ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමණාකරනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.1 | පිළිතුරු ලබාදී | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට |

| | | |
|---|---|---|
| අනුව, සමාගම විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු වුවද, 2021, 2022, 2023 සහ 2024 වර්ෂ ඇතුළත් කර ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | නොමැත. | අනුව ප්‍රසම්පාදන සැලසුම් සකස් කළ යුතුය. |
| (ආ)එකතුව රු.10,511,977 ක් වූ ප්‍රසම්පාදන 9 ක් සඳහා ප්‍රසම්පාදන කමිටු වාර්තා ඇතුලත් ප්‍රසම්පාදන ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | ප්‍රසම්පාදන කමිටු වාර්තා ඇතුලත් ප්‍රසම්පාදන ලිපිගොනු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ තත්‍ය සේවක සංඛ්‍යාව 07 ක් වූ අතර, එහි වැඩ බලන පත්වීම් 03 ක් සහ අනියම් පදනම මත පත්වීම් 04 ක් ඇතුලත් විය. | පිළිතුරු ලබාදී නොමැත. | කාර්යය මණ්ඩලය අනුමත කර අවශ්‍ය නිලධාරීන් ස්ථිර පදනම මත පත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී ඇත්තේ එම සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය, සමාජ සංවර්ධනය සහ පාරිසරික ආරක්ෂණ සැලැස්ම මත පදනම්ව වුවද, සමාගම එයට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක සහ දර්ශක හඳුනාගෙන නොතිබූ අතර නිවැරදි දත්ත සඳහා ප්‍රවේශය නොතිබුණි. භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රම ද 2023 වන විට හඳුනාගෙන නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව අරමුණු, ඉලක්ක සහ දර්ශක හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |